ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1796/12 – 2013 පෙබරවාරි 07 වැනි බ්‍රහස්පතින්දා – 2013.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 16 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/ඩබ්එස්/40.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
කේඕටී/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/1/7.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත්වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත්කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළය සුළු කොට්ඨාසයේ, මතුගොබ්බෙ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/KTP/2010/341 හා 2010.11.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0500ක් පමණ වන දෙමලියදොළ ලන්ද නමැති යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

2. **ඉඩමේ පරවශ්‍යතාවේ විස්තරය.**– දෙනියාය ජල සම්පාදන ක්‍රමයේ නිල නිවාස හා නව ජල තටාක ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතාවය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'ඒ' – දෙමලියදොළ ලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0500ක් පමණ**

උතුරට: මාසේල රාජමනී සහ තවත් අය හිමිකම් කියන දෙමලියදොළ ලන්ද; නැගෙනහිරට: මාසේල රාජමනී සහ තවත් අය හිමිකම් කියන දෙමලියදොළ ලන්ද සහ කනහලාගම පියදාස හිමිකම් කියන කැකුණහේන; දකුණට: මාසේල රාජමනී සහ තවත් අය හිමිකම් කියන දෙමලියදොළ ලන්ද සහ කනහලාගම පියදාස හිමිකම් කියන කැකුණහේන; බටහිරට: මාසේල රාජමනී සහ තවත් අය හිමිකම් කියන දෙමලියදොළ ලන්ද.

02 - 723

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 17 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/4/2012/ඩී/211.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ඒටීයූ/එල්එන්ඩී/04/ඩීඕ/38.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ


සැ.යු.– මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිය.

ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අතුරලිය.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩපත්තුව සුළු කොට්ඨාසයේ, විල්පිට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/ATR/2012/589 හා 2012.12.21 දිනැති පුගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 4.589ක් පමණ වූ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – විල්පිටවත්ත – ප්‍රමාණය: හෙක්. 4.589ක් පමණ**

උතුරට: හාලිඇල වැව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන විල්පිටවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන විල්පිටවත්ත; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන විල්පිටවත්ත, මාර්ගය සහ හාලිඇළවැව; බටහිරට: හාලිඇළ වැව.

02 - 724

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2013 අංක 18 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/9/2012/අයිආර්/210.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ගනේවත්ත.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිත්තවැලිගන්දහේ කෝරළේ සුළු කොට්ඨාසයේ, රඹාවැව (අ.ග.පි. 1268) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/GNW/2012/503 හා 2012.11.27 දිනැති පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 8.0938ක් පමණ වන පීටර්වැලිවත්ත හෙවත් රඹාවැවහේන නමැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පීටර්වැලිවත්ත හෙවත් රඹාවැවහේන – ප්‍රමාණය: හෙක්. 8.0938ක් පමණ**

උතුරට: ආර්. එල්. සන්ධ්‍යා කුමුදුනී සහ කේ. ඒ. රමණී සන්ධ්‍යා කුලතුංග හිමිකම් කියන ශාන්ත පීතරවත්ත, ඩබ්. එම්. ජේමරත්න සහ ඩබ්. එම්. ගුණපාල හිමිකම් කියන ශාන්ත පීතර වත්ත සහ ඩී. එම්. ශ්‍රියා මාලනී හිමිකම් කියන ශාන්ත පීතර වත්ත; නැගෙනහිරට: අ.ග.පි. 1268හි කෝ1040$^{n}$ වැනි බිම් කැබැල්ල (මාර්ග රක්ෂිතය); දකුණට සහ බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පීටර්වැලිවත්ත.

02 - 725

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2013 අංක 19 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/194.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
බීඩී/ඊඑල්/එල්එන්ඩී/2/ඒකිව්යූඑස්එන්/10(1).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ඇල්ල.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ සුළු කොට්ඨාසයේ, හල්පේ (අ.ග.පි. 36) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ELL/2012/424 හා 2012.10.31 දිනැති පුගමන අනුරේඛනයේ සඳහන්

ප්‍රමාණයෙන් හෙක්. 0.0253ක් පමණ වන නෙදර්වැලි කොටස නමැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – නෙදර්වැලි කොටස – ප්‍රමාණය: හෙක්. 0.253ක් පමණ**

උතුරට: වතුපාර සහ උඩුපුස්සැල්ලාව වැව්ලි සමාගම හිමිකම් කියන දෙමෝදරවත්ත; නැගෙනහිරට සහ දකුණට: උඩුපුස්සැල්ලාව වැව්ලි සමාගම හිමිකම් කියන දෙමෝදරවත්ත; බටහිරට: උඩුපුස්සැල්ලාව වැව්ලි සමාගම හිමිකම් කියන දෙමෝදරවත්ත සහ වතුපාර.

02 - 726

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.